# රුධිර පරීක්ෂා සහ රුධිර ගණන් ගැනීම්

**අපි රුධිර පරීක්ෂා නියම කිරීමට හේතුව**

රසායනික චිකිත්සාව ක්‍රියාත්මක වන්නේ පිළිකා සෛල වැනි වේගයෙන් වර්ධනය වන සෛල මරා දැමීම මගිනි. කෙසේවුවද, ඇට මිදුළු තුල වේගයෙන් වර්ධනය වන රුධිර සෛල වැනි වෙනත් හොඳ සෛලද මේ මගින් මරා දැමේ. ඔබගේ සෞඛ්‍යය රැකවරණ කණ්ඩායම විසින් ඔබ හට අඩු රුධිර ගණන් කිරීමක් සඳහා ප්‍රතිකාර කලයුතුද සහ මීළඟ රසායනික චිකිත්සා මාත්‍රාව ආරක්ෂාකාරීව ලබාදිය යුතු වන්නේ කවදාද යන්න දැනගැනීම සඳහා ඔවුන් විසින් නිතිපතා රුධිර පරීක්ෂා නියම කරනු ඇත. සෑම රුධිර පරීක්ෂාවක් සඳහාම ඔබ විසින් රෝහලට පැමිණීම අවශ්‍ය නොවේ. සමහර අවස්ථාවල ඔබගේ ප්‍රජාව තුල සිටින හෙදියන් විසින් රුධිර පරීක්ෂා කල හැකිය.

**රතු රුධිරාණු**

රතු රුධිරාණුවල පෙනහළුවල සිට ශරීරයේ වෙනත් කොටස්වලට ඔක්සිජන් ගෙනයන **haemoglobin** (හිමොග්ලොබින්) (එච්බී) අඩංගුවේ. Haemoglobin මට්ටම මගින් රතු රුධිරාණු කොපමණ ඇතිද යන්න දක්වයි. Haemoglobin මට්ටම අඩුවූවිට රක්ත හීනතාවය ඇතිවේ. ඔබගේ දරුවා සුදුමැලි පැහැවීම, වෙහෙසකර ගතිය, හිස කරකැවිල්ල, හෝ කෙටි හුස්ම ගැනීම පෙන්විය හැකිය. මෙම රෝග ලක්ෂණ දකිනම් හෝ යම් කණස්සල්ලක් ඇතිනම්, රෝහල අමතන්න. Haemoglobin අඩුවූවිට රුධිරය ලබාදීම සඳහා ඔබගේ දරුවා රෝහලට පැමිණිය යුතුවේ. රුධිරය ලබාදීමෙන් පසුව ඔබගේ දරුවාගේ සුදුමැලි ගතිය අඩුවන අතර වැඩි ශක්තියක් ඇතිවේ.

**සුදු රුධිරාණු**

සුදු රුධිරාණු මගින් ආසාදනවලට එරෙහිව සටන් කරයි. වඩාත්ම වැදගත් සුදු රුධිරාණු වන්නේ neutrophils (නියුට්‍රොෆිල්) ය. එවා මගින් බැක්ටීරියා ආසාදනවලට එරෙහිව සටන් කරයි. neutrophil ගණන අඩුවූවිට neutropaenia (නියුට්‍රොපීනියා) තත්වය ඇතිවේ. ඔබගේ දරුවාගේ neutrophil මට්ටම අඩුවූවිට ඔවුන් හට භයානක බැක්ටීරියා ආසාදන ඇතිවීමේ අවදානම දරයි. ඔබගේ දරුවා හට 38°සෙ හෝ ඊට වැඩි උණක් ඇතිනම්, **හැකි විගස** රෝහල අමතා වෛද්‍ය උපකාර ලබාගත යුතුය.

**රුධිර පට්ටිකා**

රුධිරය ගැලීම වැළැක්වීමට රුධිරය කැටිගැසීම සඳහා රුධිර පට්ටිකා අවශ්‍යවේ. ඔබගේ දරුවාගේ රුධිර පට්ටිකා ප්‍රමාණය අඩුවූ විට, thrombocytopaenia (ත්‍රොම්බොසයිටොපීනියා) යන තත්වය ඇතිවේ. සමහර අවස්ථාවල ඔබගේ දරුවාගේ රුධිර පට්ටිකා ප්‍රමාණය බොහෝ අඩුවූවිට ඔවුන් හට රුධිර පට්ටිකා ලබාදීම අවශ්‍ය විය හැකිය. ඔබගේ දරුවාගේ රුධිර පට්ටිකා ප්‍රමාණය අඩු බවට ඇති රෝග ලක්ෂණ අතර වැඩිවන සීරීම්, නහයෙන් රුධිර වහනය, විදුරුමහෙන් රුධිරය ගැලීම හෝ ඔවුන්ගේ සමෙහි සියුම් රතු පැල්ලම් ක්ෂණිකව ඇතිවීම (මේවා සියුම් සීරීම්වේ) ආදිය ඇත. මෙම රෝග ලක්ෂණවලින් කිසිවක් ඇතිනම් හෝ ඔබට යම් කණස්සල්ලක් ඇතිනම්, රෝහල අමතන්න.

**වගකීමෙන් බැහැරවීම:** අධ්‍යාපනය සහ තොරතුරු සඳහා පමණි. ප්‍රකාශනය පලකරන අවස්ථාවේ මෙහි අඩංගුදේ නිවැරදිවේ. කෙසේවුවද, කාලයක් පුරා තොරතුරු වෙනස්විය හැකිය. ඔබගේ වෛද්‍ය ප්‍රශ්න සඳහා සැමවිටම ඔබගේ සෞඛ්‍යය රැකවරණ කණ්ඩායමෙන් උපදෙස් ලබාගන්න.

සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම The Royal Children’s Hospital, Monash Children’s – Southern Health and The Peter MacCallum Cancer Centre හි Paediatric Integrated Cancer Service for the Children’s Cancer Centre මගිනි. **2011 සැප්තැම්බර්**

Paediatric Integrated Cancer Service

A statewide cancer service for children